# කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය

# ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය

# දෙවන සෙමෙස්තරය - 2023/2024

# SLG 1202 - සාහිත්‍ය ප්‍රවේශය

(කාලය පැ දෙකයි)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

01. ' මනුෂ්‍ය සමාජය හෝ මනුෂ්‍ය ජීවිතය යථාරූපී අන්දමින් නිරූපණය කරමින් සාහිත්‍යකරුවා පාඨකයාගේ ජීවන ධාරිතාව පුළුල් කරයි ' මේ අදහස ඔබ කැමති විදේශීය කෙටිකතා කිහිපයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

02. "ගතානුගතික ආකල්ප හා දෘෂ්ටිවාද නිෂේධනය කරමින් එදිරිවීර සරච්චන්ද්‍ර නූතන සිංහල සාහිත්‍ය සම්ප්‍රදායක අභිවෘද්ධියට අවශ්‍ය මං පෙත් පුළුල් කළේය". මෙම මතය සනිදර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

03. "මාර්ටින් වික්‍රමසිංහගේ විරාගය නවකථාවෙහි නිරූපිත ' සරෝජිනී' හා ' බති ', ලාංකේය සමාජයෙහි තරුණියක හා බිරිඳක ලෙසින් එදා මෙදාතුර ' සම්ප්‍රදාය හා නූතනත්වය ' තුළ ස්ත්‍රිය විෂයෙහි සනාතන ජීවනාර්ථ විදහා දක්වයි". මේ සම්බන්ධයෙන් විචාරාත්මක විවරණයක් කරන්න.

04. "නූතන සිංහල කවිය අධ්‍යයනයේදී අලුත් කවියන්ගේ හා කිවිඳියන්ගේ පරිකල්පන ශක්තිය පමණක් නොව, ජීවිතය හා සමාජය තියුණු මානයකින් විනිවිද දකිනා'යුරු ද විද්‍යමාන වන්නේය" ඔබ කැමති ' අලුත් කවි - කිවිඳියන්' කිහිප දෙනෙකුගේ නිර්මාණ ඔස්සේ මේ අදහස පිරික්සන්න.

05. මතු දැක්වෙන කවීන් තිදෙනාගෙන් කෙනෙකු තෝරාගෙන නූතන සිංහල කාව්‍ය ක්ෂේත්‍රයෙහි වර්ධනය උදෙසා ඔබ තෝරා ගත් කවියාගේ කාර්ය සාධනය පිරික්සන්න.

    I. ගුණදාස අමරසේකර
    II. සිරි ගුනසිංහ
    III. මහගමසේකර

06. " ජීවත්වීමේ ආශාවෙන් මඩනා ලද ස්ත්‍රියකගේ ඉරණම, සාම්ප්‍රදායික කතා පුවතක් ඇසුරින් එදිරිවීර සරච්චන්ද්‍ර විලාසිනියකගේ ප්‍රේමය නම් වූ චම්පූ කාව්‍යයෙන් විවරණය කර තිබේ." නූතන පාඨකයාට මේ කෘතියෙන් කවරාකාර ජීවන ආස්වාදයක් ලැබේදැයි පෙන්වා දෙන්න.

    නැතහොත්

    විභූතිභූෂණ බන්දොපාධ්‍යායගේ අරණ්‍යකට පෙම්බැඳ නවකථාවේ නිරූපිත සත්‍යචරණගේ ආත්ම කථනය ඔස්සේ මානව ජීවිතය හා මනුෂ්‍ය සම්බන්ධතා සම්බන්ධයෙන් පාඨකයාට අත් කරගත හැකි අවබෝධය කවරාකාරදැයි පැහැදිලි කරන්න.